Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

**08 ශ්‍රේණිය** **ඉතිහාසය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයිඃ
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 පුරාණයේ ජල්ලුරවාපී ලෙස හඳුන්වා ඇත්තේ ..............................................

(i) මාදතුගම වැව (ii) යෝධ වැව
(iii) හුරුළු වැව (iv) මහකනදරා වැව

02 මහ අස්ථාන කුමරු උඩරට රජ වන්නේ ................................................. නමිනි.

(i) II රාජසිංහ (ii) I රාජසිංහ
(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ (iv) කීර්ති ශ්‍රී රාජසිංහ

03 අයිබිරියන් අර්ධද්වීපය තුළ පිහිටි විශාලම රට ..............................................

(i) පෘතුගාලය (ii) ප්‍රංශය
(iii) ස්පාඤ්ඤය (iv) ජර්මනිය

04 බර්තොලමියුඩයස් ඇතුළු පිරිස ලඟා වූ දකුණු අප්‍රිකානු තුඩුව ........................................

(i) කුණාටු තුඩුව (ii) සුබ ප්‍රාර්ථනා තුඩුව
(iii) සමුගැනීමේ තුඩුව (iv) අග්නිදිග තුඩුව

05 මධ්‍යකාලීන යුගයේ ප්‍රසිද්ධියට පත්ව තිබූ කළු මුහුද ආසන්නයේ පිහිටි වෙළඳ නගරය කුමක් ද?

(i) ජිනෝවා (ii) වැනීසිය
(iii) කොන්ස්තන්තිනෝපල් (iv) ෆ්ලෝරන්ස්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් වරහන තුළ (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06 මුල්ලේරියා සටන සිදුවන විට සීතාවක හමුදාවට නායකත්වය ලබාදුන්නේ මහ අස්ථාන කුමරු විසිනි. ( )

07 යුරෝපයේ කලා ශිල්පීන්ට ස්වාධීනව සිය දක්‍ෂතා ඉස්මතු කිරීමට අවස්ථාව උදාවූයේ පුනරුද සමයේ දී ය. ( )

08 මධ්‍යකාලීන යුගයේ ආසියාවේ වෙළඳ ආධිපත්‍යය පවත්වාගෙන යනු ලැබුයේ යුරෝපා ජාතීන් විසිනි. ( )

09 පෘතුගීසින් සිය ආර්ථික කටයුතු සංවිධානය කරනු ලැබුයේ විඩෝර්ද පැසෙන්ඩා නම් විශේෂ නිළධාරින් යටතේ ය. ( )

10 පෘතුගීසි කපිතාන් අසවේදු හා කෝට්ටේ ජන ප්‍රධානීන් එක්ව කෝට්ටේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් අත්සන් කළ ගිවිසුම මල්වානේ ගිවිසුම නමින් හඳුන්වයි. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහතින් දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැන මත ලියන්න.**

(ශ්‍රී විජය රාජසිංහ / බතාවිය / පර්ඩිනන්ට් මැගලන් / මෙඩිසි / සෙයිලාන් / කීර්ති ශ්‍රී රාජසිංහ / ජකර්තා)

11 ...................................................................... රජු වැලිවිට සරණංකර හිමිට ''සංඝරාජ'' තනතුර පිරිනමන ලදී.

12 ලන්දේසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය ජාවා දූපතේ ............................................................... නගරය කේන්ද්‍ර කොටගෙන ගොඩනැගී තිබුණි.

13 ලෝකය වටා ප්‍රථම වරට ගමන්කොට, ලෝකය ගෝලාකාර බව තහවුරු කළ දේශගවේෂකයා වූයේ ............................................................................... ය.

14 යුරෝපයේ පුනරුදයට හේතු වූ කලාත්මක කටයුතුවල දියුණුව සඳහා අනුග්‍රහය දැක්වූ ප්ලෝරන්ස් නගරයේ සිටි ධනවත් පවුල ......................................................................... නමින් හැඳින්විය.

15 පෘතුගීසින් ලංකාව හඳුන්වා ඇත්තේ ............................................................................ නමිනි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16 මහනුවර යුගයේ දී පොළොවේ ගල්කණු සිටුවා ඒ මත ඉදිකරන ලද විහාර හඳුන්වා ඇත්තේ ....................................................................... විහාර ලෙසිනි.

17 මහනුවර දළදා මාලිගාවට පත්තිරිප්පුව එක් කරන ලද්දේ ..................................................... රජතුමා විසිනි.

18 පෘතුගීසි පාලනය යටතේ ගම්වල කුරුඳු තලන්නන්ගේ කටයුතු භාර නිළධාරියා ............................................ නමින් හැඳින්විය.

19 සීතාවක රාජසිංහ රජු මරණයට පත්වූයේ ....................................................... උයනේ දී උණ කටුවක් ඇනී විෂ ශරීරගත වීමෙනි.

20 පල්ලියට යාබදව ගම්වල පවත්වාගෙන ගිය පෘතුගීසි පාසල් ........................................................... පාසල් නමින් හැඳින්විය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (සියලු පිළිතුරු වෙනම කොළයක ලියන්න.)

---


01 A දී ඇති ලංකා සිතියම ඇසුරෙන් (i), (ii), (iii), (iv) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සීතාවක රාජධානිය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?


(ii) කලාවැව දක්වා ඇති අක්ෂරය කුමක් ද?

(iii) සෙංකඩගල රාජධානියේ අග නගරය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(iv) මිණිපේ අමුණ දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 04)




B දී ඇති ලෝක සිතියම් කොටස ඇසුරෙන් පහත (i), (ii), (iii), (iv) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) K අක්ෂරයෙන් දක්වා ඇත්තේ යුරෝපයේ පුනරුදය ආරම්භ වූ රටයි. එය කුමක් ද?


(ii) ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය පිහිටා තිබූ රට C අක්ෂරයෙන් දක්වා ඇත. එම රට නම් කරන්න.

(iii) පෘතුගීසීන්ගේ මව් රට D අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?

(iv) ලන්දේසීන්ගේ පෙරදිග පාලන මූලස්ථානය පිහිටා තිබූ දූපත L අක්ෂරයෙන් දැක්වේ. එම දූපතේ නම ලියන්න. (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

C



දී ඇති පින්තූරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) පින්තූරයේ දැක්වෙන මූර්තිය නම් කරන්න.

(ii) මෙහි නිර්මාණ ශිල්පියා කවුරුන් ද?

(iii) ඔහු විසින් නිර්මාණය කළ තවත් ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ල. 04)

D



(i) පින්තූරයේ දැක්වෙන කුරහන් ගල පූජනීය වස්තුවක් වීමට හේතුව කුමක් ද?

(ii) මෙම කුරහන්ගල දැකගත හැකි විහාරය පිහිටා ඇත්තේ කොහේද?

(iii) මෙහි තිබූ පූජනීය වස්තුව උඩරටට වැඩමවා පූජෝපහාර පැවැත්වූ රජතුමා කවුද?

(iv) එම රජතුමා රාජත්වයට පෙර හැඳින් වූ නම කුමක් ද? (ල. 04)

02 පුරාණ ජල තාක්‍ෂණයේ විශිෂ්ඨත්වය පිළිඹිබුවන අංග දෙකක් ලෙස අමුණු බැඳීම හා ඇල මාර්ග තැනීම හඳුන්වා දිය හැකිය.

(i) පුරාණයේ මිනිසා තාවකාලික වේලි තැනීමට යොදාගත් ද්‍රව්‍ය 3 ක් ලියන්න. (ල. 03)

(ii) දී ඇති ඇල මාර්ග ප්‍රකාශන හා ගලපන්න.

(තීලවත්ථුක ඇල / මිණිපේ ඇල / ඇලහැර ඇල / යෝධ ඇල)

A වසභ රජතුමා අඹන් ගඟ හරහා වේල්ලක් බැඳ උතුරු ප්‍රදේශවලට ජලය ගෙනගිය ඇල


B කලාවැවේ සිට තිසාවැවට ජලය ගෙනයාමට ධාතුසේන රජු තැනවූ ඇල

C මහවැලි ගඟේ සිට ජලය පොළොන්නරුවට ගෙනයාමට I අග්ගබෝධි රජු තැනවූ ඇල

D මින්නේරි වැවට ජලය ලබාගැනීමට මහසෙන් රජු තැනවූ ඇල (ල. 04)

(iii) මහ වැව් තැනීම නිසා ලාංකිකයා ලැබූ ජයග්‍රහන දෙකක් ලියන්න. (ල. 04)

03 රජරට ශිෂ්ටාචාර සමයට අයත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ සුවිශේෂී නිමාවකින් හා විශිෂ්ඨ තාක්‍ෂණයකින් යුතුය.




(i) පුරාණ ගඩොල් හා වර්තමාන ගඩොල් අතර ඇති වෙනස්කම් තුනක් ලියන්න. (ල. 03)

(ii) පුරාණයේ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වූ චෛත්‍යයේ A, B, C, D අංග නම් කරන්න. (ල. 04)

(iii) පුරාණ ආරෝග්‍ය ශාලාවල නටබුන් අතරින් හඳුනාගත හැකි සුවිශේෂී ඉදිකිරීම් 04 ක් ලියන්න. (ල. 04)

04 (i) (a) පෙරදිග වෙළඳ කටයුතු සඳහා ලන්දේසීන් පිහිටුවාගත් සමාගම කුමක් ද? (ල. 01)


(b) ලංකාවෙන් යුරෝපයට ගෙන ගිය වෙළඳ භාණ්ඩ 03 ක් නම් කරන්න. (ල. 03)

(c) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය ව්‍යාප්ත කළ යුරෝපා ජාතීන් 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) යුරෝපයේ පුනරුද සමයේ බිහි වූ නිර්මාතෘණ හා නිර්මාණ ශිල්පීන් ඇසුරින් නිවැරදි පිළිතුර යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

| නිර්මාණ | නිර්මාණ ශිල්පීන් |
|---|---|
| ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව | (i) ........................................ |
| (ii) ........................................චිත්‍රය | මයිකල් ආන්ජිලෝ |
| මොනාලිසා චිත්‍රය | (iii) ........................................ |
| (iv) ........................................ | ජොහැන්නස් ගුටන්බර්ග් |

05



(i) A මෙම චිත්‍රය කුමන යුගයට අයත් ලක්ෂණ ප්‍රදර්ශනය කරයි ද?

B මෙම යුගයේ චිත්‍ර සඳහා වැඩිපුර භාවිතා කර ඇති වර්ණය කුමක් ද?

C එකළ සාම්ප්‍රදායික වර්ණ සකස් කිරීමට යොදාගත් ද්‍රව්‍යයක් ලියන්න. (ල. 03)

(ii) මෙම චිත්‍ර සඳහා තේමා වූ ජාතකකථා දෙකක් ද, මෙම ලක්ෂණ සහිත චිත්‍ර දැකගත හැකි ස්ථාන දෙකක් ද නම් කරන්න. (ල. 04)

(iii) මෙම යුගයට අයත් සිතුවම්වල කැපී පෙනෙන ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

06 (i) පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ කැපී පෙනුන ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(ii) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරු අත්පත් කර ගැනීම නිසා යුරෝපා ජාතීන්ට මුහුණ දීමට සිදුවූ ගැටලු 3 ක් ලියන්න. (ල. 03)

(iii) A සොයා ගැනීමට අදාළ විද්‍යාඥයා නම් කරන්න.


(i) මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගැනීම.

(ii) ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු හා ප්‍රතිකර්ම සොයා ගැනීම. (ල. 02)

B ප්‍රංශ ජාතීන් ඉන්දියාව තුළ වෙළඳ ගබඩා පිහිටවූ ස්ථාන තුනක් නම් කරන්න. (ල. 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07 (i) ප්‍රහේලිකාව නිවැරදිව සම්පූර්ණ කරන්න.




හරහට

1. පෘතුගීසි සහ උඩරට රජු අතර වූ රන්දෙනිවල සටනට නායකත්වය දුන් පෘතුගීසි ජාතිකයා
2. දිගු මුහුදු ගමන්වල දී දිසාව සොයාගැනීමට භාවිතා කරයි.
3. ජයවීර බණ්ඩාරගෙන් පසුව උඩරට රජ වූ පාලකයා
4. වස්කෝද ගාමා ඉන්දියාවට ගොඩබට වරාය

පහළට

1. තාරකා විද්‍යාවේ පියා ලෙස හඳුන්වයි.
2. ග්‍රහලෝක සූර්යයා වටා ගමන් කරන හැඩය වේ. (ල. 06)

(ii) විජයබාකොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය බෙදී ගිය කොටස් තුන නම් කරන්න. (ල. 03)

(iii) පෘතුගිසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීම කෙරෙහි බලපෑ කරුණු 02 ක් ලියන්න. (ල. 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

01. හුරුළු වැව 02. II රාජසිංහ 03. ස්පාඤ්ඤය 04. කුණාටු තුඩුව
05. කොන්ස්තන්තිනෝපල් 06. (✗) 07. (✓) 08. (✗) 09. (✓)
10. (✓) 11. කීර්ති ශ්‍රී රාජසිංහ 12. බතාවිය 13. පර්ඩිනන්ට් මැගලන්
14. මෙඩිසි 15. සෙයිලාන් 16. ටැම්පිට විහාර 17. ප්ලෝරන්ස්
18. මහබද්දේ කපිතාන් 19. පෙතංගොඩ 20. පැරිස්

(2 x 20 = ල. 40)

## II කොටස

01. A (i) B (ii) X (iii) C (iv) H (ල. 04)
B (i) ඉතාලිය (ii) එංගලන්තය (බ්‍රිතාන්‍ය) (iii) පෘතුගාලය (iv) ජාවා (ල. 04)
C (i) පියෙටා රුව (ii) මයිකල් ආන්ජිලෝ (iii) ඩේවිඩ් ප්‍රතිමාව, මෝසෙස් ප්‍රතිමාව (ල. 04)
D (i) දළදාව සඟවා තැබීම නිසා (ii) කුරුවිට දෙල්ගමුව විහාරය
(iii) I විමලධර්මසූරිය (iv) කොනප්පු බණ්ඩාර (ල. 04)

02 (i) ලී දඬු / කොළ අතු / වැලි / පස් / පිදුරු (ල. 03)
(ii) A ඇලහැර ඇල B යෝධ ඇල C මිණිපේ ඇල D තීලවත්පුක ඇල (ල. 04)
(iii) ගල්කුට්ටි යොදා බැම්ම තැනීම / ජල පහරේ වේගය අඩු ස්ථානයකින් තැනීම / පොළව යටින් ගල් තලාවක් විහිදුන තැනක් තෝරා ගැනීම (ල. 04)

03 (i) ප්‍රමාණයෙන් විශාල වීම / ජලය උරාගැනීම අවම වීම / ශක්තිමත් බව හා ගඩොල්වල බර දරාගැනීමේ හැකියාව වැඩිය. (ල. 03)
(ii) A පේසාවළලු B ගර්භය C හතරැස් කොටුව D දේවතා කොටුව (ල. 04)
(iii) බෙහෙත් ඔරු / ශෛල්‍ය වෛද්‍ය උපකරණ / බෙහෙත් ගබඩා / බෙහෙත් නිෂ්පාදන ශාලා (ල. 04)

04 (i) A - පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම (VOC) (ල. 01)
B - ඇත්දළ, මුතු මැණික්, කුලුබඩු වර්ග (ගම්මිරිස් / කුරුඳු / එනසාල්) (ල. 03)
C - පෘතුගීසීන් / ලන්දේසී / ඉංග්‍රීසී (ල. 03)
(ii) (i) ඩොනෙටෙලෝ (ii) අවසාන විනිශ්චය / සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ චිත්‍ර
(iii) ලියනාඩෝ ඩාවින්චි (iv) මුද්‍රණ යන්ත්‍රය (ල. 04)

05 (i) A මහනුවර යුගයේ චිත්‍ර කලාවේ ලක්ෂණ
B රතු වර්ණය
C ශාක ද්‍රව්‍ය / ඛනිජ (ල. 03)
(ii) වෙස්සන්තර ජාතකය / දහම් සොඬ ජාතකය / තේලපත්ත ජාතකය / දඹුල්ල / දෙගල්දොරුව / දළදා මාළිගාව / මුල්ගිරිගල (ල. 04)
(iii) බිත්තිය තීරුවලට බෙදා චිත්‍ර ඇඳ තිබීම / රූප රාමුවට යටින් කථා පුවත නම්කර තිබීම / හිස්තැන් පිරවීමට මල් මෝස්තර ගස් ඇඳ තිබීම / ශාක හා මිනිස් රූපවල ප්‍රමාණාත්මක ගුණය නොසලකා හැරීම (ල. 04)

06 (i) උස් කුළුණු නිර්මාණය / වටකුරු ආරුක්කු නිර්මානය / අර්ධ ගෝලාකාර ශිඛර නිර්මාණය (ල. 03)
(ii) නිසි වේලාවට භාණ්ඩ ලබානොදීම / භාණ්ඩ මිල ඉහළ දැමීම / තීරු ගාස්තු ලෙස ඉහළ මිලක් ගෙවීමට සිදුවීම / යුරෝපා ජාතීන්ගේ වෙළඳ මාර්ග අවහිර වීම (ල. 03)
(iii) A විලියම්හාවේ / වෛද්‍ය පැරසල්සස් (ල. 02)
B පොන්ඩිචෙරි / කරිකාල් / චන්ද්‍රනගර් (ල. 03)

07 (i) <u>හරහට</u>
1. කොන්ස්තන්තිනූද සා 2. මාලිමාව 3. කරලියැද්දෙ 4. කැලිකට්
<u>පහළට</u>
1. කොපර්නිකස් 2. ඉලිප්ස්සාකාර (ල. 06)
(ii) කෝට්ටේ / සීතාවක / රයිගම (ල. 03)
(iii) 1. උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
2. උඩරට ජනතාවගේ සහාය රජුට ලැබීම... (පෙළ පොත පිටුව 73 බලන්න.) (ල. 02)